JMC vLearning
"your virtual learning partner"

# තනි පුද්ගල බදුකරණය
# (Taxation of Individual)

තුෂාර ඉංදික ජයවීර

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව ඕනෑම පුද්ගලයෙකුට උද්ගත වන ආදායම් ප්‍රභව වන්නේ,

1. සේවා නියුක්තිය මත තක්සේරු වන ආදායම
2. ව්‍යාපාර මත තක්සේරු වන ආදායම
3. ආයෝජන මත තක්සේරු වන ආදායම
4. අනෙකුත් කටයුතු මත තක්සේරු වන ආදායම

මෙම ආදායමේ බදු කටයුතු සඳහා තක්සේරු කරන ආකාරය පිළිබඳව ඉහත දී සාකච්ඡා කර ඇත.

ඒ අනුව තනි පුද්ගලයකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද තක්සේරු කිරීම පහත ආකාරයට විස්තර කළ හැකිය.

පුද්ගලයාගේ නම :

තක්සේරු වර්ෂය :

ආදායම් බදු ගණනය

| | + | - | බදු නිදහස් ආදායම් | බද්දට යටත් ආදායම් |
|---|---|---|---|---|
| සේවා නියුක්ති ආදායම | x | (x) | (x) | xxx |
| ව්‍යාපාර ආදායම | | | | xxx |
| ආයෝජන ආදායම | | | | xx |
| අනිකුත් ආදායම් | | | | xx |
| තක්සේරුවන ආදායම | | | | xxx |
| <u>52 වගන්තියට අනුව</u> | | | | |
| සුදුසුකම් ලබන | | | x | |
| ගෙවීම් සහ සහන | | | x | |
| | | | | (xx) |
| බදු අයවන ආදායම | | | | xxx |

ඒ අනුව (1) සහ (2) සමස්ථය එම පුද්ගලයාගේ මුළු බදු වගකීම බවට පත්වේ - (2 වන වගන්තියට අනුව)

ඒ අනුව තක්සේරු වන ආදායම තෙක් ගණනය කිරීම පිළිබඳ අවබෝධය අප ඉහත දී ආවරණය කර ඇත.

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### බදු අයවන ආදායමට ගණනය

පනතේ 52 වන වගන්තියේ සඳහන් වන සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන අඩු කිරීමෙන් එම තැනැත්තාගේ බදු අයවන ආදායම ආගණනය කළ හැකිය. ඒ සඳහා මෙම සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන පිළිබඳ අවබෝධය වැදගත් වේ.

### සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන - 52 වගන්තිය

### පස්වන උපලේඛනයේ සඳහන් සහන

1. පුද්ගල බදු සහනය තක්සේරු වර්ෂයට රු. 500,000 කි.
2. සේවා නියුක්තිකයකුට සේවා නියුක්තිය මත තක්සේරු වර්ෂයට අතිරේක සහනය රු. 700,000 දක්වා.
3. කුලී ආදායම් තක්සේරු වන කොටස මත 25% ක දීමනාවක් (සත්‍ය අළුත් වැඩියා අඩු කර නොමැති විට)
4. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මූල්‍ය ආයතනයන්ගෙන් උද්ගතවන පොලී ආදායම රු.1,500,000 දක්වා සහනය.
5. වාසික පුද්ගලයෙකුගෙන් හවුල් ව්‍යාපාරයක හවුල් කරුවෙකුට ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටත සැපයූ සේවා මත විදේශ විනිමය ලැබීම් රු. 15,000,000 දක්වා.

| බදු ගණනය | | |
|---|---|---|
| අදාළ බදු අනුපාත පනතේ උපලේඛණ වලට අනුව | | x |
| ගෙවිය යුතු බද්ද | | xxx |
| බදු බැර | x | |
| | x | (x) |
| (1) ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) බද්ද | | xxx |
| අවසාන බදු ගෙවූ ආදායම් | | xxx |
| අවසාන බදු ගෙවූ ආදායම මත බදු අනුපාත | | x% |
| ගෙවිය යුතු බද්ද | | xxx |
| අවසාන රඳවාගත් බදු මඟින් ගෙවූ බදු | | (xx) |
| (2) ගෙවිය යුතු ඉතිරි වූ බද්ද | | xxx |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### පස්වන උපලේඛණයේ සඳහන් සුදුසුකම් ලබන ගෙවීම්

6. පහත කොන්දේසි සපුරන අනුමත පුන්‍ය ආයතනයකට සිදු කළ පරිත්‍යාග.
   i. අනුමත පුන්‍ය ආයතනයකට
   ii. මුදලින් කල පරිත්‍යාග
   iii. එම පුන්‍ය ආයතනය අවශ්‍ය තැනැත්තන්ට ආයතනිකමය රැකවරණය සපයන විට.

   පහත සීමාවන්ට යටත්ව අඩු කළ හැක.

| | |
|---|---|
| සත්‍ය පරිත්‍යාග වියදම | xxx |
| තක්සේරුවන ආදායමින් 1/3 | xxx |
| උපරිමය | රු. 75,000 |

   යන අගයන්ගෙන් අඩු අගය සුදුසුකම් ලබන ගෙවීමක් වේ.

7. පහත ආයතනයකට මුදලින් හෝ වෙනත් අයුරකින් සිදු කළ පරිත්‍යාග සීමාවකින් තොරව අඩු කළ හැකිය.
   i. ශ්‍රී ලංකා රජයට
   ii. විශ්ව විද්‍යාල පනතට යටත්ව පිහිට වූ උසස් අධ්‍යාපන ආයතනයකට
   iii. බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයට
   iv. ශ්‍රී ලංකා රජය විසින් පිහිට වූ අරමුදලකට
   v. ප්‍රාදේශීය අධිකාරියක් මගින් ඇමතිවරයාගේ අනුමැතිය මත පිහිට වූ අරමුදලකට
   vi. ප්‍රාදේශීය අධිකාරියකට
   vii. සෙවණ අරමුදලකට
   viii. පළාත් සභා මගින් ඇමතිවරයාගේ අනුමැතිය මත පිහිට වූ අරමුදලකට
   ix. අපි වෙනුවෙන් අපි අරමුදලට
   x. ජාතික වකුගඩු අරමුදලට
   xi. රාජ්‍ය සංස්ථාවක් මගින් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කළ ලාභ

ඉහත සුදුසුකම් සපුරන ගෙවීම් හෝ සහන අඩු කළ පසු එම තැනැත්තාගේ බදු අයවන ආදායම ගණනය කළ හැකිය.

### ගෙවිය යුතු බද්ද ගණනය

බදු අයවන ආදායම මත ගෙවිය යුතු බද්ද ගණනය කිරීම සඳහා අදාල බදු අනුපාත පනතේ උපලේඛණවල සඳහන් වන ආකාරයට පහත දැක්වේ. ඒවා ආදාල පරිදි යොදා ගැනීමෙන් එම තැනැත්තාගේ ගෙවිය යුතු බදු වගකීම ගණන කල හැකිය.

පනතේ පළමු උපලේඛණයට අනුව,


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

1. සාමාන්‍ය පුද්ගලයෙකුගේ ආදායම් මත

| බදු අයවන ආදායම | බදු අනුපාත / ගෙවිය යුතු බද්ද |
|---|---|
| 600,000 දක්වා | 4% |
| 600,000 > 1,200,000< | 8% |
| 1,200,000>1,800,000< | 12% |
| 1,800,000>2,400,000< | 16% |
| 2,400,000 >3,000,000< | 20% |
| 3,000,000> ඉක්ම වූ කොටස | 24% |

1. ආයෝජන වත්කම් විකිණීමේ ලාභ මත 10%
2. සේවා නියුක්තියේ සඳහන් බද්දට යටත් සේවාන්තික ලැබීම් මත

- සේවා කාලය වසර 20 ට අඩු නම්

| | |
|---|---|
| 2,000,000 < දක්වා | 0% |
| 2,000,000>3,000,000< දක්වා | 5% |
| 3,000,000 > ඉතිරිය මත | 10% |

- සේවා කාලය වසර 20 ට වැඩි නම්

| | |
|---|---|
| 5,000,000 < දක්වා | 0% |
| 5,000,000>6,000,000< දක්වා | 5% |
| 6,000,000 > ඉතිරිය මත | 10% |

ඉහත අදාල බදු අනුපාත යොදා ගනිමින් එම තැනැත්තා ගෙවිය යුතු බදු වගකීම ගණනය කළ හැකි අතර එම වගකීම මත මෙතෙක් නිරවුල් කර ඇති බදු මුදල් වේ නම් අඩු කර ගැනීමේ අයිතිය පුද්ගලයෙකු සතු වේ. එම අයිතිය බදු බැරක් වශයෙන් හඳුනා ගනී.

### පුද්ගලයෙකුට අදාල බදු බැර

1. ගෙවූ උපයන විට ගෙවීම් බදු
2. ස්වතක්සේරු බදු ගෙවීම්
3. විදේශ බදු බැර
4. ගෙවූ ආර්ථික සේවා ගාස්තු
5. හවුල් ව්‍යාපාර ලාභ මත ගෙවූ රඳවාගත් බදු


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ඒ අනුව ගෙවිය යුතු බද්දට ඉහත සඳහන් බදු බැර තිබේනම් අඩු කිරීමෙන් (හිලව්) එම තැනැත්තාගේ ගෙවිය යුතු ඉතිරි බදු වගකීම් හෝ වැඩිපුර ගෙවූ බද්ද ගණනය කළ හැකිය.

ඉහත ගණනය කිරීමට අමතරව ගණනය කළ යුතු ඉතිරි කොටස වන්නේ අවසාන රඳවා ගැනීමේ ගෙවීම් මත බදු වගකීම වේ. ඒ සඳහා අවසාන රඳවා ගැනීමේ ගෙවීම් මොනවාද යන්න දැන ගැනීම අවශ්‍ය වේ. ඒවානම්,

**අවසාන රඳවා ගැනීමේ ගෙවීම්**

1. වාසික සමාගමක් ගෙවූ ලාභාංශ
2. පොලී ගෙවීම් - (ජ්‍යේෂ්ඨ පුරවැසි රු.1,500,000/- සහ අනුමත පුණ්‍ය ආයතන හැර)
3. සූදු, ඔට්ටු, ලොතරැයි දිනුම්
4. නිර්වාසිකයකුට ව්‍යාපාර ගණුදෙනු මත නොවන, ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයකින් ගෙවීම්.

**මෙම ගෙවීම් සඳහා අදාල බදු අනුපාත වන්නේ,**

1. ලාභාංශ මත 14%
2. පොලිය මත 5%
3. සූදු ඔට්ටු ලොතරැයි මත 14%
4. අනේවාසිකයින් සඳහා ගෙවීම් මත අදාල ආදායම මත පුද්ගල රඳවාගත් බද්ද

මෙම ගෙවීම් මත බදු අදාල පරිදි ගණනය කළ පසු එම ගෙවීම් මත ගෙවා ඇති රඳවා ගැනීමේ බදු අඩු කළ හැකිය. එසේ අඩු කළ පසු ගෙවිය යුතු ඉතිරියක් වේ නම් එම අගය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd